ස.සේ.කො.චක්‍රලේඛ අංක : 03/2018(i)

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල, දෙවන මහල,
කුරුණෑගල.
2020.02.24

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය හා,
වයඹ සමුපකාර මහා සංගමය, ස.ණ.ස. සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමිති හා සංගම් වල ගරු සභාපති හා
සාමාන්‍යාධිකාරීවරුන් වෙත,

**සමුපකාර සේවකයින් ලබා ගන්නා වෘත්තීය සුදුසුකම්, තනතුරු ලබා ගැනීමේදී, උසස් වීමේදී හා වැටුප් වර්ධක ලබා ගැනීමේදී සළකා බලනු ලබන ආකාරය**

ඉහත කරුණට අදාලව නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 3/2018 චක්‍රලේඛයේ වගන්ති අංක 03 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමට 2020.02.07 දින පැවති කොමිෂන් සභාව නියෝග කර ඇත. මෙම සංශෝධනය 2020.02.07 දින සිට බලාත්මක වන බවත් වැඩිදුරටත් දන්වමි.

03. "සේවකයෙකු කිසියම් තනතුරකට බඳවා ගැනීම සඳහා සලකා බලන ලද මූලික අධ්‍යාපන සුදුසුකම් එම තනතුරේ ශ්‍රේණි උසස් කිරීම් වලදී නැවත සලකා නොබලන නමුත්, සේවකයා වෙනත් තනතුරකට බඳවා ගන්නා විට ඔහුගේ පූර්ව තනතුර අනුමැතියට හා ශ්‍රේණි උසස් කිරීම් වලදී සලකා බලන ලද අධ්‍යාපන සුදුසුකම් නව තනතුරෙහි මූලික සුදුසුකමක් ලෙස චක්‍රලේඛානුකූලව දක්වා ඇත්නම් එම සුදුසුකම නව තනතුර සඳහා සලකා බැලිය හැකිය"

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී.විජේරූප,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

රේණුකා පී. විජේරූප
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
වයඹ පළාත.

පිටපත්- :
1. ප්‍රධාන ලේකම් - ප්‍රධාන ලේකම් කාර්යාලය,වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි . - අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි. - අ.ක.ස.